# සිංහල භාෂාව හා සාහිත්‍යය තරග 2024(කලාප)

අපේක්ෂකයාගේ නම- ------------------------------------------------------------------------------------------
(මුලකුරු සමග නම)

පාසලේ නම හා ලිපිනය- ------------------------------------------------------------------------------------------
------------------------------------------------------------------------------------------

පාසල් වර්ගය- 200 ට අඩු / 201-500 / 501 ට වැඩි

කොට්ඨාසය- ------------------------------------------------------------------------------------------

කලාපය- ------------------------------------------------------------------------------------------

**9 වසර** **ගද්‍ය රචනා හා ප්‍රායෝගික ලේඛන** කාලය පැය 02 (මුළු ලකුණු 100)

I කොටසින් එකක්ද II කොටසේ (අ) යටතේ එකක්ද (ආ) යටතේ එකක්ද (ඉ)යටතේ කොටස් එකක්ද වශයෙන් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

## I කොටස

❖ පහත දැක්වෙන මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 300 කට නොඅඩු රචනාවක් ලියන්න.
(අ). පොතපත කියවා හෙට ලොව ජය ගනිමු .
(ආ).දේශිය සංස්කෘතිය ලොවට කියන ජාතික උත්සව
(ඇ).ගැමි දිවියේ මිහිර ගෙනෙන ජන සාහිත්‍යය
(ඈ) .අධ්‍යාපනය සාර්ථක දිවියකට මඟ සලසයි.
(ඉ)ජාතික සමගිය තුළින් රට ගොඩ නගමු.

ලකුණු 40

## II කොටස

(අ) I. මෙවර වෙසක් පොහොය නිමිත්තෙන් ඔබේ ගමේ පැවැත්වෙන වෙසක් කලාපය නැරඹීම සඳහා පැමිණෙන ලෙස ඉල්ලා සිටිමින් කොත්මලේ සිටින ලොකු නැන්දාට යවන ලිපිය ලියන්න.

ලකුණු 20

II.ඔබ 'සුහද මිතුරු ' ළමා සමාජයේ ලේකම් යැයි සිතන්න.2024. ජුලි මස 05 වන දින කොළඹ පිහිටි ග්‍රහලෝකාගාරය නැරඹීමට යාම සඳහා එක් දින චාරිකාවක් සූදානම් කර ඇත . සිසුන් 50දෙනෙකු පමණ මේ සඳහා සහභාගී වේ.ග්‍රහලෝකාගාරය නැරඹීමට අවශ්‍ය ප්‍රවේශපත්‍ර වෙන් කරවා ගැනීම සඳහා එහි අධ්‍යක්ෂකවරයා වෙත යවන ලිපිය සකස් කරන්න.

ලකුණු 20

(ආ)I.ඔබ ප්‍රදේශයෙන් ගලා බසිනා වලවේ ගං ඉවුරේ වැලි ගොඩ දැම්මේ ජාවාරමක් සිදුවේ. මේ වන විට ගං ඉවුරේ ඇතැම් ස්ථාන දැඩි ලෙස ඛාදනය වී ඇත.එහි අහිතකර ප්‍රතිඵල පෙන්වා දෙමින් මේ තත්ත්වය වලක්වාලීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ ජනතාව දැනුවත් කිරීමට සුදුසු අත් පත්‍රිකාවක් සකස් කරන්න.

ලකුණු 20

II. වෙසක් සතිය නිමිත්තෙන් ඔබ විද්‍යාලයේ පැවැත්වූ විවිධ වැඩසටහන් පිළිබඳව තොරතුරු ඇතුලත් කරමින් පුවත්පත් වාර්තාවක් සකස් කරන්න. ඔබ සෙවනගල ප්‍රාදේශිය වාර්තාකරු උදිත කෝසල යැයි සිතන්න.

ලකුණු 20

(ඉ)I. ඔබ විද්‍යාලයේ සිංහල සාහිත්‍ය සංගමය මගින් සිසු නිර්මාණ ප්‍රදර්ශනයක් පැවැත්වීමට සූදානම් කර ඇත .එය පැවැත්වෙන්නේ 2024 ජුලි මස 20 වන දින පෙරවරු 8.30 - පස්වරු 1.30 දක්වාය.ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකතුමා සහභාගී වේ. මේ අවස්ථාවට සහභාගී වන ලෙස දන්වමින් අවට පාසල්වල විදුහල්පතිවරුන්ට යවන ආරාධනා පත්‍රයක් සකස් කරන්න.

ලකුණු 20

II. ඔබ විද්‍යාලයේ බෞද්ධ සංගමය මගින් පොසොන් පොහොය නිමිත්තෙන් පෙරහැරක් සංවිධානය කර ඇත.පෙරහැර පැවැත්වෙන දිනය වේලාව ගමන් මාර්ගය පිළිබඳව ප්‍රදේශවාසින් දැනුවත් කිරීමට සුදුසු දැන්වීම පිළියෙල කරන්න.

ලකුණු20